දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතිය - 2019
-------------------------------------------------------

දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම ව්‍යාපෘතියේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු නිදහස් කිරීම් සහ මූල්‍ය තොරතුරු ලිපි සහ මූල්‍ය ගිවිසුමේ III (ii) වගන්තිය සහ 2019 අප්‍රේල් 11 දිනැති ණය ගිවිසුම් අංක 6346-LK යටතේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සමායතනය (IDA) සමග එළඹ තිබුණු ණය ගිවිසුමේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් සහ වැඩසටහනෙහි කාලසීමාව
-------------------------------------------------------------------------

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව කෘෂිකර්ම අමාත්‍යාංශය ක්‍රියාත්මක කිරීමේ ආයතනය වන අතර ජාත්‍යන්තර සංවර්ධන සමායතනය ව්‍යාපෘතියේ ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. තෝරාගත් සංවේදී ස්ථානවල කුඩා වතු හිමියන්ගේ කෘෂිකර්මාන්තයේ ඵලදායිතාව සහ දේශගුණයට ඔරොත්තු දීමේ හැකියාව වැඩි දියුණු කිරීම ව්‍යාපෘතියේ අරමුණු වේ.

වැඩසටහනේ ණය ගිවිසුමට අනුව, වැඩසටහනේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය එජඩො මිලියන 140 කට සමාන රු. මිලියන 25,200 ක් වූ අතර ඉන් එජඩො මිලියන 125 කට සමාන රු. මිලියන 22,500 ක් ජාත්‍යන්තර සංවර්ධනය සමායතනය විසින් මූල්‍යනය කිරීමට එකඟ වී තිබුණි. ඉතිරි මුදල එජඩො මිලියන 15 කට සමාන රු. මිලියන 2700 ක් ශ්‍රී ලංකා රජය විසින් සහ ප්‍රතිලාභීන් විසින් මූල්‍යනය කරනු ලැබේ.

මෙම වැඩසටහන 2019 මැයි 07 වන දින එහි කටයුතු ආරම්භ කර තිබුණු අතර එය 2024 ජුනි 30 දින වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි.

## 1.3 තත්ත්වාගණනය කළ මතය
------------------------------

මෙම වාර්තාවේ 02 වන ඡේදයේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මං දරන්නා වූ මතය වේ.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම
---------------------------------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) සහ ව්‍යාපෘති විගණනය පිළිබඳ කෘෂිකාර්මික සංවර්ධන මාර්ගෝපදේශ සඳහා වන ජාත්‍යන්තර අරමුදලට අනුකූලව මා විසින් විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම
-------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ආයතනය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

ව්‍යාපෘතියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව්කිරීම්වල යෝග්‍යතාවය ඇගයීම.

- හෙළිදරව්කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක් කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

  මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූලාප්‍ර කාශන පිළිබ දඅදහස් දැක්වීම

## 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
| --- | --- | --- | --- |
| (අ) කොන්ත්‍රාත්කරුවන් 17 දෙනෙකු සඳහා ගෙවා තිබූ රු. 68,771,682 ක් වූ ස්ථානගතවීම සඳහා අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර තිබුණි. | වියදම් වැඩියෙන් ගිණුම්ගත වීම. | කොන්ත්‍රාත්කරුවන්ට ලබා දී ඇති අත්තිකාරම් සමාලෝචිත වර්ෂයේ සංවර්ධන වියදම් ගිණුමට හර කර ඇත. | වර්ෂය සඳහා අදාළ වන වියදම් පමණක් ගණනය කළ යුතු අතර අත්තිකාරම් මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම අනාවරණය කළ යුතු බව. |
| (ආ) ව්‍යාපෘති ඇගයීම් ලේඛනයට අනුව ව්‍යාපෘති කාලය තුළදී ප්‍රතිලාභීන්ගේ දායකත්වය රු. මිලියන 900 ක් එනම් ඇමරිකානු ඩොලර් මිලියන 5 කට සමාන මුදලක් සංරචක දෙකකින් ලබා ගත යුතුය. කෙසේ වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල පමණක් දක්වා තිබූ ප්‍රතිලාභීන්ගේ දායකත්වය රු. මිලියන 27,699,100 පිළිබඳව ගණනය කිරීමේ ක්‍රමවේදය, දායකත්ව වර්ගය සහ වෙනම සංරචක දෙක සඳහා එක් එක් ප්‍රතිලාභීන්ගෙන් ලබාගත් දායක මුදල විගණනයට ඉදිරිපත් නොවූ බැවින් විගණනයේදී සත්‍යාපනය කළ නොහැකි විය. | වැරදි ගණනය කිරීම හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනයේ දක්වා ඇති ප්‍රතිලාභීන්ගේ වටිනාකම වැඩියෙන්/අඩුවෙන් දක්වා තිබීම. | නිරීක්ෂණයට එකඟ වේ. | ප්‍රතිලාභීන්ගේ දායකත්වය ගොවියාගේ සත්‍ය දායකත්වය මත පදනම් විය යුතු අතර එය මූල්‍ය ප්‍රකාශනයේ හෙළිදරව් කළ යුතු බව. |

## 2.2 නීති,රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම් විගණන නිරීක්ෂණය | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද 2019 මාර්තු 15 දිනැති අංක 01/2019 චක්‍රලේඛය | ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම මාස 02 කට වරක් පැවැත්විය යුතුය. | අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි විය. | පසුගිය මාස 06 ක කාලය තුළ අපි Covid - 19 වසංගත තත්වයන්ට මුහුණ දී ඇත්තෙමු. එබැවින් මෑතකදී ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම් සංවිධානය කිරීමට නොහැකි විය. | චක්‍රලේඛයේ උපදෙස් අනුව ව්‍යාපෘති මෙහෙයුම් කමිටු රැස්වීම කාලානුරූපීව පැවැත්විය යුතු බව. |
| (ආ) ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ ඇමුණුම 2 හි 21 වන වගන්තිය | අදාළ රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය ව්‍යාපෘතියේ අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. | දුර්වල අභ්‍යන්තර පාලන පද්ධතිය | කළමනාකාරිත්වය විසින් ප්‍රතිචාර දක්වා නොමැත. | ව්‍යාපෘතිය විගණනය කළ යුත්තේ අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය විසිනි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 04 වන පරිච්ඡේදයේ 4.2 වගන්තිය | ප්‍රසම්පාදන සැලැස්ම හා ප්‍රසම්පාදන කාලසටහන ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුව සකස් කළ යුතුය. | අපේක්ෂිත ප්‍රතිඵල අත්කර ගැනීමට නොහැකි විය. | . | ප්‍රසම්පාදන සැලැස්ම සහ කාලසටහන සම්පූර්ණව සකස් කළ යුතුය. |

**03.** භෞතික කාර්ය සාධනය

-------------------------

ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් සංරචක 04 කින් සමන්විත විය. එනම් කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවිකරණය, කෘෂිකර්මාන්තය සඳහා ජලය, ව්‍යාපෘති කළමනාකරණය සහ අවිනිශ්චිත හදිසි ප්‍රතිචාර. ශ්‍රී ලංකාවේ උතුරු පළාතේ පරිපාලන දිස්ත්‍රික්ක 11 ක (කිලිනොච්චි සහ මුලතිව්) නැගෙනහිර පළාතේ (ත්‍රිකුණාමලය, මඩකලපුව සහ අම්පාර) උතුරු මැද පළාතේ (අනුරාධපුර සහ පොලොන්නරුව) වයඹ පළාතේ කුරුණෑගල සහ පුත්තලම) දකුණු පළාත (හම්බන්තොට) සහ ඌව පළාත (මොණරාගල) මූලික ව්‍යාපෘති ප්‍රතිලාභීන් 470,000 කට වැඩියෙන්, කුඩා පරිමාණ ගොවීන් (හෙ.375,000) වනු ඇත. මෙම ව්‍යාපෘතිය වසර හයකට වැඩි කාලයක් (2018-2024) ක්‍රියාත්මක වේ. කෘෂිකර්ම අමාත්‍යාංශය (MOA) ප්‍රධාන ව්‍යාපෘති ඒජන්සිය වේ. ඉහත සඳහන් සංරචක 04 හි ප්‍රගතිය සම්බන්ධව පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**3.1** ව්‍යාපෘතියේ කටයුතු ආරම්භ කිරීම ප්‍රමාද වීම

---------------------------------------------

| | ක්‍රියාකාරකම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අනුරාධපුරයේ රනෝරාව වැව පුනරුත්ථාපන ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් පැකේජය -01 සහ පැකේජය -02 යටතේ පුද්ගලික කොන්ත්‍රාත්කරුවන් 02 දෙනෙකුට රු. මිලියන 8.52 ක අත්තිකාරමක් 2019 දෙසැම්බර් 24 වන දින ගෙවා තිබුණි. කෙසේ වුවද, 2020 ජුනි 22 දක්වාම කොන්ත්‍රාත් වැඩ ආරම්භ කර නොතිබුණි. | භෞතික ප්‍රගතිය ඉතා අඩු බැවින් ඉදිකිරීම් කටයුතු ගිවිසුම් කාලය තුළ සම්පූර්ණ කිරීමට නොහැකි වනු ඇත. | විගණන විමසුම සමග එකඟ වේ. | ආරම්භය හා වැඩ ප්‍රමාද වීම සම්බන්ධයෙන් පියවර ගත යුතු බව. |
| (ආ) | ව්‍යාපෘති ඇගයීම් ලේඛනයේ 34 වන වගන්තියට අනුව, ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් කාලානුරූපීව සමාලෝචනය කිරීමට හා තක්සේරු කිරීමට හැකිවන පරිදි කළමනාකරණ තොරතුරු පද්ධතියක් (MIS) ස්ථාපිත කිරීම හා පවත්වාගෙන යාම අවශ්‍ය විය. කෙසේ වුවද, 2020 ජුනි 22 දක්වා කළමනාකරණ තොරතුරු පද්ධතිය ස්ථාපිත කිරීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. | අපේක්ෂිත ප්‍රතිඵලය අත්කර ගැනීමට නොහැකි විය. | TOR සඳහා MIS දැනටමත් සකස් කර ඇත. MIS සඳහා CSIAP 2020 ඔක්තෝබර් 31 දිනට පෙර ක්‍රියාත්මක කිරීමට අපි බලාපොරොත්තු වෙමු. | කළමනාකරණ තොරතුරු පද්ධතිය ප්‍රමාදයකින් තොරව ස්ථාපිත කළ යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| (ඇ) | මහ කන්නයේ සිට ව්‍යාපෘති කටයුතු ක්‍රියාත්මක කිරීමේ අරමුණින් පළාත් **06** සඳහා උපදේශකයින් සිව් දෙනෙකු තෝරාගෙන රු. **65,502,182** ක් වන කොන්ත්‍රාත්තු ප්‍රදානය කර තිබුණු අතර පළාත් මට්ටමින් දේශගුණ සුහුරු වාරි සැලැස්මක් සකස් කිරීම සඳහා අත්තිකාරම් සහ කොටස් ගෙවීම් වශයෙන් උපදේශක සමාගම් වෙත රු.**42,033,122** ක් ගෙවා තිබුණි. වර්ෂයක් ගතවී ඇතත්, ඉහත සැලැස්ම සකස් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය ඉතා අසතුටුදායක මට්ටමක පැවතුනි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදී ජනරජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවල **6.6.4** වගන්ති ප්‍රකාරව උපදේශකයින්ගෙන් අත්තිකාරම් ඇපකර සහතිකයක් ලබාගෙන නොතිබුණු අතර දේශගුණ සුහුරු වාරි කෘෂිකර්ම සැලැස්ම සකස් කිරීම සඳහා තෝරාගත් උපදේශක සමාගම් හතර සඳහා රු.**4,935,472** ක් ගෙවා තිබුණි. | ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය අසතුටුදායක මට්ටමක පැවතුනි. | නිරීක්ෂණයට එකඟ වන අතර ජනාධිපතිවරණය, ක්‍රියාකාරී සැලැස්මේ සිදු කරන ලද වෙනස්කම් සහ උපදේශක විසින් ඉල්ලා සිටින සත්‍ය පරිමාණ ස්ථාන සිතියම නොතිබීම වැනි විවිධ හේතූන් සැලසුම් සකස් කිරීම ප්‍රමාද වීමට හේතු විය. | දේශගුණ සුහුරු වාරි සැලැස්ම කාලානුරූපීව සකස් කිරීමට අවශ්‍ය පියවර ගත යුතු බව. |

**3.2** මානව සම්පත් කළමනාකරණයට අදාළ ගැටළු

| | ක්‍රියාකාරකම | බලපෑම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කර ඇති ජල කළමනාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු තනතුර සඳහා ව්‍යාපෘති කාර්යාලය විසින් බඳවා නොගැනීම හේතුවෙන් භෞතික අධීක්ෂණය හා ප්‍රමාණවත් ඇගයීමක් සිදු කර නොමැති අතර කොන්ත්‍රාත් කටයුතු සඳහා උපදෙස් හා නිසි මග පෙන්වීම් ව්‍යාපෘති කාර්යාලය විසින් ලබා දී නොතිබුණි. | ව්‍යාපෘතියේ කටයුතු ප්‍රමාද වන අතර නිසි අධීක්ෂණයකින් තොරව කොන්ත්‍රාත් වැඩ කටයුතු කරගෙන යමින් තිබුණි. | ජල කළමනාකරණයපිළිබඳ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු 2020 අප්‍රේල් මාසයේදී ඉල්ලා අස් වූ අතර උපදේශන පදනම මත ඉංජිනේරුවරයෙකු පත් කිරීම සඳහා ප්‍රසම්පාදන ක්‍රියාවලිය දැනටමත් ආරම්භ කර ඇත. | ව්‍යාපෘතියේ ප්‍රධාන තනතුර සඳහා ප්‍රමාදයකින් තොරව බඳවා ගත යුතු බව. |
| (ආ) | කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අනුමැතිය ඇතිව කාර්ය මණ්ඩලය බඳවා ගන්නා තෙක් කෘෂිකර්ම අමාත්‍යාංශයේ සේවය කරන සුදුසුකම් ලත් නිලධාරීන්ගේ රාජකාරි ආවරණය කරන ලෙස 2018 අගෝස්තු 01 දිනැති කැබිනට් තීරණ අංක අමප/18/1433/820 /015 මගින් දැනුම් දී තිබුණි. එබැවින් රේඛීය අමාත්‍යාංශයේ සහ අදාළ පළාත් සභාවල නිලධාරීන් 40 දෙනෙකු අර්ධකාලීන පදනමින් ද සේවකයින් 06 ක් දෛනික ගෙවීම් පදනම මත ඉහත කාර්ය මණ්ඩලයේ රාජකාරි ආවරණය කිරීම සඳහා යෙදවීමට කටයුතු කර තිබුණු අතර ව්‍යාපෘතියේ ස්ථිර කාර්ය මණ්ඩලය බඳවා ගැනීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය 2018 සැප්තැම්බර් 12 සහ 2019 මාර්තු 18 දින ලැබී තිබුණද, රු.8,267,863 ක් 2019 දෙසැම්බර් 31 දක්වා වේතන ලෙස ගෙවා | දුර්වල මානව සම්පත් කළමනාකරණය | නිරීක්ෂණය සමග එකඟවේ. ව්‍යාපෘතියේ පිරිවැය අවම කිරීම මත පදනම්ව අප අර්ධකාලීන සේවකයින් බඳවාගෙන ඇත්තෙමු. | (අ) ව්‍යාපෘති අධ්‍යක්ෂ/ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂවරුන් විසින් මාසය ආරම්භයේදී අර්ධකාලීන කාර්ය මණ්ඩලයට මාසික කාර්ය කාලසටහන ලබා දිය යුතු බව.<br><br>(ආ) සිදු කරන ලද තථ්‍ය වැඩ පිළිබඳ විස්තර අදාළ අධීක්ෂණ නිලධාරීන් විසින් අර්ධකාලීන කාර්ය මණ්ඩලයෙන් ලබා ගත යුතු බව.<br><br>(ඇ)අර්ධකාලීන නිලධාරීන්ගේ පැමිණීම PMU විසින් පවත්වා ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | තිබුණි. එබැවින්, අනුමත කාර්ය මණ්ඩලය සඳහා ස්ථිර සේවකයින් බඳවා නොගැනීම ව්‍යාපෘතියේ භෞතික කාර්ය සාධනය පහත වැටීමට සැලකිය යුතු බලපෑමක් ඇති කර තිබුණි. | | | (ඇ) නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ (PMU) විසින් නිකුත් කරන ලද අංක MOA / CSIAP / PMU / පරිපාලක හා 2019 සැප්තැම්බර් 18 දිනැති චක්‍රලේඛයට අනුව අර්ධ කාලීන නිලධාරීන්ගේ සෑම මසකම සත්‍ය සේවා කාලය මත පදනම්ව මාසික දීමනා ගණනය කළ යුතු බව. |
| (ඇ) | සමාලෝචිත වර්ෂය තුළ ප්‍රසම්පාදන විශේෂඥයින් හය දෙනෙකු බඳවාගෙන තිබුණද, ප්‍රසම්පාදනය සම්බන්ධ ප්‍රමාණවත් කාර්යයන් ඔවුන්ට පවරා නොතිබුණි. | ප්‍රසම්පාදන විශේෂඥයා වෙනුවෙන් වියදම් කිරීම ඵල රහිත වීම. | නිරීක්ෂණය සමග එකඟවේ. | සේවයේ යොදවා ඇති සියලුම ප්‍රසම්පාදන විශේෂඥයින් පත්වීම් ලිපි අනුව කාර්යක්ෂමව රාජකාරි ඉටු කළ යුතු බව. |
| (ඇ) | ක්‍රියාකාරී සැලැස්මට අනුව සමාලෝචිත වර්ෂය තුළ සංරචක 3 යටතේ රු.මිලියන 520.5 ක් වියදම් කිරීමට අපේක්ෂිතව තිබූ නමුත් මහා භාණ්ඩාගාරය විසින් අයවැය ඇස්තමේන්තුව තුළ රු. මිලියන 440 ක් පමණක් වෙන්කර තිබුණි. කෙසේ වුවද, ව්‍යාපෘතියේ මහා භාණ්ඩාගාරය විසින් වෙන් කරන ලද රුපියල් මිලියන 440 න් සත්‍ය වියදම රු. මිලියන 256.5 ක් එනම් සියයට 58 ක් නියෝජනය කර තිබුණි. මන්දගාමී මූල්‍ය ප්‍රගතිය සඳහා ප්‍රධාන හේතු වන්නේ අතිශය සංවේදී කලාප සංවර්ධන සැලැස්ම (HSAADP) සකස් කිරීමට අපොහොසත්වීම සහ ව්‍යාපෘතියේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම සඳහා ව්‍යාපෘතියේ මුළු | භාවිතයට නොගත් ප්‍රතිපාදන සඳහා බැඳීම් ගාස්තු ගෙවිය යුතු අතර සැලැස්මේ සඳහන් පරිදි මූල්‍ය ප්‍රගතියට ළඟා වීමට නොහැකි වනු ඇත. | නිරීක්ෂණය සමග එකඟවේ. | ක්‍රියාකාරී සැලැස්මට අනුව අරමුදල් උපයෝගී කර ගැනීමට පියවර ගත යුතු බව. |

| | | | | |
|---|---|---|---|---|
| | කාලය ආවරණය වන පරිදි සවිස්තරාත්මක ක්‍රියාකාරී සැලැස්ම සහ ජල කළමනාකරණය පිළිබඳ ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු, ජල සම්පත් සංවර්ධන විශේෂඥ, ප්‍රසම්පාදන විශේෂඥ, සමාජ සංවර්ධන නිලධාරී, සංවර්ධන නිලධාරී, කළමනාකරණ සහකාර වැනි ප්‍රධාන තනතුරු බඳවා ගැනීම ප්‍රමාද කිරීම විය. | | | |
| (ඉ) | සමාලෝචිත වර්ෂය වන විට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයේ සහ නියෝජ්‍ය ව්‍යාපෘති අධ්‍යක්ෂ කාර්යාලයේ අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු 26 ක් පිරවීමට පියවර ගෙන නොමැති අතර වර්තමාන කාර්ය මණ්ඩලයේ සේවකයින් 43 දෙනෙකු අර්ධකාලීන පදනමින් බඳවාගෙන තිබුණි. | දුර්වල මානව සම්පත් කළමනාකරණය | අයදුම්පත් කැඳවා ඇති අතර සම්මුඛ පරීක්ෂණ නියමිත වේලාවට පවත්වනු ලැබේ. | ව්‍යාපෘතියේ සුමට මෙහෙයුම් සඳහා තවදුරටත් ප්‍රමාදයකින් තොරව පුරප්පාඩු පිරවිය යුතු බව. |